Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂයඃ- පෙරදිග සංගීතය

ජූනි සතියඃ- 4

ශ්‍රේණිය ඃ- 10

Prepared by- Ravi Kurulugama
(Music Teacher:- Ke/Dehi/Waharaka M.M.V.

නිපුනතා මට්ටම 1ඃ- ඃ- වාද්‍ය භාණ්ඩයන්ගේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

❖ තෝරාගත් ගත් භාණ්ඩයකින් ස්වරලිපි බලා වාදනය

වයලීන්, ගිටාර්, බටනලා, මැන්ඩලීන්, එස්රාජ්, සිතාර් ඕනෑම සංගීත භාණ්ඩයකින් නිවැරදිව ගීතයක් වාදන කිරීම මෙම පාඩමෙන් බලාපොරොත්තු වෙයි.

❖ පහත පිළිවලට අනුගමනය කරමින් ප්‍රායෝගිකව අභ්‍යාසයේ යෙදෙන්න
  ○ වාදනයේ නිවැරදි ඉරියවු හසුරුවමින් ස්වර සප්තකයේ ආරෝහණ අවරෝහණ ස්වර වාදනය කරන්න (වාදනයේ වේගය (ලය) ක්‍රමයෙන් වැඩි කර නිරන්තර පුහුණු වන්න.)
  ○ පහත ස්වර අභ්‍යාස නිවැරදි ශිල්පක්‍රම අනුගමණය කර වාදනය කිරීමට පුහුණු වන්න
    ▪ ආරෝහණ ඃ-සරග,රිගම,ගමප,මපධ,පධනි,ධනිස
      අවරෝහණඃ- සනිධ,නිධප,ධපම,පමග,මගරි,ගරිස

ඔබ අතට ලබා දී ඇති ස්වර ප්‍රස්තාරය පහත උපදෙස් අනුව වාදනයට පුහුණු වන්න. සියලු දෙනා එක්ව සාමූහික ව සාකච්ඡා කරන්න. අවශ්‍ය විටෙක පමණක් ගුරු උපදෙස් පතන්න.

පියවර 1. එහි Scale (ශ්‍රැතිය) අනුව භාවිත කර ඇති ස්වර හඳුනා ගන්න.

2. ප්‍රස්තාර ගත තාලයට අනුව ස්වර ප්‍රස්තාරය රිද්මයානුකූල ව කියවන්න.
ප්‍රස්තාරය මාත්‍රා තුනෙන් තුන බෙදෙන ගීයක නම් 1 2 3 යනා දී වශයෙන් රිද්මයානුකූල ව ගණන් කර (count) කියවීම අරඹන්න. ප්‍රස්තාරය කියවීමේ දී විභාගය තුළ ඇති ස්වර මත ඒ ඒ මාත්‍රාවට ඇඟිල්ල තබමින් ගණින්න. වෙනත් තාලයක දී ද $\frac{4}{4}$ $\frac{6}{8}$ මෙම ක්‍රමයම අනුගමනය කරන්න.

3. රිද්මයට අනුව ස්වර යෙදී ඇති ආකාරය නිවැරදිව කියවා ගැනීම සඳහා පහත උදාහරණය පරිදි "ට" අක්ෂරය භාවිත කිරීම ප්‍රමාණවත් ය.

උදාඃ 1. ධ ප ධ / ස - රි / ග - ධ / ප - ප /
ට ට ට / ටා - ට / ටා - ට / ටා - ට /

2. ග - ම ප / ම - ග - / රි - ස නි̣ / රි - ස -
ටා - ට ට / ටා - ටා - / ටා - ට ට / ටා - ටා -

මෙසේ හොඳින් පුහුණු වීමෙන් ප්‍රස්තාරය තුළ ස්වර ගමන් කරනු ලබන රටාව වටහා ගත හැක.

- මම ස්වර ප්‍රස්ථාරය වාදන කිරීමට පුහුණු වන්න.

<u>දියගොඩ සැමතැන</u>

/පපමම/ගගරිරි/සරිගම/ප---/
/ප-ම-/ගමපධ/නිනිධධ/ප---/
/ස්ස්නිනි/ධධප-/පධපම/ග-රි-/
/පධපම/ග-රි-/ස--- /----- /
/සරිගම/ප--ස/නිනිධධ/ප---/
/මමගරි/ග--- /රි-නිරි/ස---/

- *<u>ක්‍රියාකාරකමඃ-</u>*

01- ඉහත කරුණු හා ස්වර ප්‍රස්ථාරය සටහන් පොතේ ලියාගන්න.
02- ආරෝහණ අවරෝහණ හා ස්වර අභ්‍යාස නිවැරදිව වාදනය කරීමට පුහුණු වන්න.
03- ඉහත ගීතය නිවැරදිව වාදනය කිරීමට පුහුණුවන්න
04- ඉහත ගීතය හැර වෙනත් නිර්දේශිත ගීතයක ස්වර ප්‍රස්ථාරයක් නිවැරදිව වාදනය කිරීමට පුරුදුවන්න
  ❖ අන්තරජාලයේ මේ සම්බන්ද ඇති පාඩම් වැඩිදුරට අධ්‍යනය කැන්න.

(ඒ සඳහා ඊ නැණපියස, ඊ තක්ෂලා, යූටියුබ්, වැනි වෙබ් අඩවි භාවිතා කළ හැකිය) ඔබට අවශ්‍ය ස්වර ප්‍රස්ථාර ලබා ගැනීමට "Music Lanka" APPS ඔබගේ ජංගම දුරකථනයට ඇතුළු කර ගන්න.